# 10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## 14 පාඩම


**සැකසුම හා ඉදිරිපත් කිරීම**

**ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා**

**කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.**

**අධීක්ෂණය**

**බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා**

**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 14 පාඩම

# පටිච්ච සමුප්පාද න්‍යාය හැඳින ගනිමු

# බුදු දහමේ මූලික හරය පටිච්ච සමුප්පාදය යි.

- බුදු දහමේ මූලික හරය නම් පටිච්ච සමුප්පාද ධර්මය යි
- ‘පටිච්චසමුප්පාදය’ යන යෙදුම තුළින් සහේතුක බව, හේතු සහිත බව, අහේතුක නොවන බව කියවෙයි

# පටිච්ච සමුප්පාද න්‍යාය හැඳින ගනිමු

- බුදු දහමට අනුව අහේතුකව ලොව කිසිවක් හට නොගනී; නොපවතී; සෑම දෙයක්ම හේතුවක් ඇතිව ම හටගනී. එසේම හේතුව තිබෙනතාක් ඵලය ද පවතී

"හේතුප්පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති"

- බුදුරදුන් පෙන්වා දෙන්නේ සත්ත්වයා සහ ලෝකය හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගෙන ඇති බවයි. ඒ නිසා බුදු දහම අදේවවාදී හේතුඵලවාදී දහමකි

# අස්සජි මහරහතන් වහන්සේ විසින් උපතිස්ස පරිබ්‍රාජකතුමාට දේශනා කළ බෞද්ධ හේතුඵල ධර්මය ඇතුළත් ගාථාව හා අර්ථය

## ගාථාව

යේ ධම්මා හේතුප්පභවා
තේසං හේතුං තථාගතෝ ආහ
තේසං ච යෝ නිරෝධෝ
එවං වාදී මහාසමණෝ

අස්සජී මහරහතන් වහන්සේ

## අර්ථය

- හේතුවෙන් උපදින යම් ධර්ම කෙනෙක් වෙත් ද ඒ ධර්මයන්ගේ හේතුව තථාගතයන් වහන්සේ වදාළහ
- ඒ ධර්මයන්ගේ යම් නිරෝධයක් වේද එය ද දේශනා කළ සේක
- මහා ශ්‍රමණ වූ ඒ තථාගතයන් වහන්සේ මෙබඳු දේශනාවක් කරන්නෙකි

# පටිච්ච සමුප්පාද න්‍යාය

- ලෝකයේ පුද්ගල, වස්තු, සිද්ධි වශයෙන් දක්නට ලැබෙන කිසිවක් තනිව ක්‍රියාත්මක නොවේ
- සෑම ක්‍රියාවක ම, සෑම සිද්ධියක ම අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවතී. ඒ සම්බන්ධතාව හේතු හා ඵල වශයෙන් දක්වනු ලැබේ

උදා :- තණ්හාව ඇති කල්හී දුක ඇත

තණ්හාව නැති කල්හී දුක නැත

- පටිච්ච සමුප්පාද න්‍යාය වශයෙන් දැක්වෙන්නේ මේ හේතුඵලවල අනුරූපී සම්බන්ධතාව ප්‍රකට කරන ක්‍රමය යි

# පටිච්ච සමුප්පාද මූල සූත්‍රය හා අර්ථය

01
අවස්ථාව

ඉමස්මිං සති ඉදං හෝති
මෙය ඇති කල්හි මෙය වෙයි
ඉමස්ස උප්පාදා ඉදං උපපජ්ජති
මෙය ඉපදීමෙන් මෙය උපදී

ඉමස්මිං අසති ඉදං න හෝති
මෙය නැති කල්හි මෙය නොවේ
ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති
මෙය නැති වී යාමෙන් මෙය නැතිව යයි

02
අවස්ථාව

# පටිච්ච සමුප්පාද මූල සූත්‍රය ඇසුරෙන්

ඉමස්මිං සති ඉදං හෝති
මෙය ඇති කල්හි මෙය වෙයි
ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති
මෙය ඉපදීමෙන් මෙය උපදී

හේතුව ඇති කල ඵලය ඇත
(අනුලෝම)

දැල්වෙන පහන

තෙල් හා තිරය තිබෙන තාක්කල් පහන දැල්වේ

මෙහි හේතුව :- තෙල් හා තිරය යි
ඵලය :- පහන දැල් වී තිබීම යි

ඉමස්මිං අසති ඉදං න හෝති
මෙය නැති කල්හි මෙය නොවේ
ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති
මෙය නැති වී යාමෙන් මෙය නැතිව යයි


හේතුව නැති කල ඵලය නැත
(පටිලෝම)

නිවී ගිය පහන

මෙහි හේතුව :- තෙල් හා තිරය අවසන් වීම යි
ඵලය :- පහන නිවී යාම යි

# පටිච්ච සමුප්පාද නිදසුන් ඇසුරෙන්

කෝටු මිටි දෙකක් **A, B** වශයෙන් එකිනෙකට ආධාරයක් වී පවතින අයුරු මෙහි දැක්වේ




A ඇති නිසා B පවතී

B ආධාරක වීමෙන් A පවතී

A නැති කල්හී B නැත

B ආධාරකය නැති කල්හී A නැත

# බුදුන් වහන්සේ පටිච්ච සමුප්පාද න්‍යායට අනුව සමාජ ගැටලු ඇතිවන අයුරු පැහැදිලි කළ ආකාරය



# තෙරුවන් සරණයි...!